ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2306/72 – 2022 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා – 2022.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩපත්තුව සුළු කොට්ඨාසයේ දෙයියන්දර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MLT/2019/240 හා 2022.01.20 දිනැති සංශෝධිත ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – **කළුගලමහගේන** *නොහොත්* **විජයගොඩඅප්පුගෙගේන** *නොහොත්* **දංගේන – ප්‍රමාණය: හෙක්. 0.0954ක් පමණ**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගල්කඩුවවත්ත; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගල්කඩුවවත්ත සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගල්කඩුවවත්ත.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/2/2018/S/443.
2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0206


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩපත්තුව සුළු කොට්ඨාසයේ රන්සෑගොඩ (අ.ග.පි. 97) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MLT/2020/296 හා 2020.11.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලි දෙකට (02) මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වැකඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0253**

උතුරට: කැබලි අක්ෂර B, මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ එම්. කමලාවතී හිමිකම් කියන කොස්ගහහේන; නැගෙනහිරට: එම්. කමලාවතී හිමිකම් කියන කොස්ගහහේන සහ ලලිත් හෙට්ටිආරච්චි හිමිකම් කියන වැකඩවත්ත; දකුණට: ලලිත් හෙට්ටිආරච්චි හිමිකම් කියන වැකඩවත්ත; බටහිරට: කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර 'B' – වැකඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0062**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව); නැගෙනහිරට: කැබලි අක්ෂර A; දකුණට: ලලිත් හෙට්ටිආරච්චි හිමිකම් කියන වැකඩවත්ත; බටහිරට: ලලිත් හෙට්ටිආරච්චි හිමිකම් කියන වැකඩවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව).

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/5/2020/HA/22.
2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 - 0207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.